# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2024.02.01 |

## පාලක මණ්ඩලය විසින් නව සහකාර අධිපතිවරු සය දෙනෙක් පත් කෙරෙති

ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් 2024 ජනවාරි 19 වන දින පැවති රැස්වීමේ දී ආචාර්ය සී. අමරසේකර, ඩබ්ලිව්. ඒ. දිල්රුක්ෂිනී මහත්මිය, ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර, ඩී.එස්. ඩබ්ලිව්. සමරතුංග මහත්මිය, ඊ. එච්. මොහොට්ටි මහත්මිය සහ ආර්. ඩී. ටී. ගුණසේකර මහත්මිය යන අය 2024 ජනවාරි 22 වන දින සිට සහකාර අධිපති ධුරයට උසස් කරන ලදී.

**ආචාර්ය සී. අමරසේකර**



ආචාර්ය අමරසේකර වසර 21කට අධික කාලයක් මහ බැංකුව සඳහා සේවය කර ඇත. වර්තමානයේ දී ඔහු ඇමෙරිකාවේ වොෂින්ටන් නුවර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංග්ලාදේශය සහ භූතානය යන රටවල් සඳහා කටයුතු කිරීමට මුදා හැර ඇත. මහ බැංකුවේ දී ඔහු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රතිපත්තිය සහ පර්යේෂණ කටයුතුවලට විශේෂිත වූ විවිධ තනතුරු දරමින්, පුළුල් ලෙස සිය සේවය සැපයුවේ ය. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති කමිටුවේ දිගු කාලීන නිත්‍ය සාමාජිකයෙකු සහ ලේකම්වරයා ලෙස සේවය කිරීමට අමතර ව, ආචාර්ය අමරසේකර මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව, වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව, විදේශීය ණය කළමනාකරණ කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, පුහුණුකරණ කමිටුව සහ පුස්තකාල උපදේශන යන කමිටුවල සාමාජිකයෙකු විය. තවද ඔහු හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ සහ පුහුණුකරණ ආයතනයේ අධිපති මණ්ඩලයේ සාමාජිකයෙකු මෙන් ම, විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සහ ජාතික විද්‍යා පදනමේ සාමාජිකයෙකු ද විය.

මුදල් ප්‍රතිපත්තිය සහ මහ බැංකු අනෙකුත් තේමාවන් පිළිබඳ ව ආචාර්ය අමරසේකර සිදු කළ පර්යේෂණ පත්‍රිකා විවිධ ජාත්‍යන්තර සහ දේශීය සඟරාවන්හි පළ වී ඇති අතර, එය පුළුල් පිළිගැනීමකට සහ උපුටා ගැනීම්වලට ද ලක් ව ඇත. එමෙන් ම, ඔහු 2015-2020 කාලයේ දී මහ බැංකුවේ පර්යේෂණ සඟරාවක් වන මාණ්ඩලික පත්‍රිකා මාලාවේ සංස්කාරක ලෙස කටයුතු කළේ ය. ඔහු විවිධ විශ්වවිද්‍යාල, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ බැංකු විදු පියස ඇතුළු ව විවිධ අධ්‍යයන හා වෘත්තීය ආයතනවල බාහිර කථිකාචාර්යවරයකු, විභාග පරීක්ෂකවරයෙකු සහ ප්‍රශ්න විචාරකයකු ලෙස ස්වේච්ඡාවෙන් සේවය කර ඇත.

එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ව ආචාර්ය උපාධියත්, එම විශ්වවිද්‍යාලයෙන් ම ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් ලබා ගෙන ඇති ආචාර්ය අමරසේකර පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ලබා ඇත. එමෙන් ම ඔහු නීතිඥවරයෙකු ද වේ.

**ඩබ්ලිව්. ඒ. දිල්රුක්ෂිනී මහත්මිය**



ඩබ්ලිව්. ඒ. දිල්රුක්ෂිනී මහත්මිය සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකාව ලෙස කටයුතු කළ අතර, මහ බැංකුව තුළ වසර 23කට අධික අත්දැකීම් ඇය සතු ය. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධුරය භාර ගැනීමට පෙර, ඇය ආර්ථික පර්යේෂණ, සංඛ්‍යාන යන දෙපාර්තමේන්තුවල සහ බැංකු විදු පියසෙහි විවිධ ධුරයන් හෙබවූවා ය. මිල සහ ආර්ථික ස්ථාවරත්වය සහ මූල්‍ය පද්ධති ස්ථාවරත්වයට අදාළ ව ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා ප්‍රවීණතා ඇය සතු වේ. තව ද, ඇය ශ්‍රී ලංකා මහ බැංකුවේ තිරසර මූල්‍ය කර්තව්‍යයන්හි ප්‍රධානත්වය ගෙන කටයුතු කළා ය. ඇය මූල්‍ය පද්ධති සථාවරත්ව කමිටුවේ සාමාජිකාවක වන අතර, මූල්‍ය පද්ධති ස්ථාවරත්ව අධීක්ෂණ කමිටුවේ ලේකම්වරිය ලෙස ද සේවය කර ඇත. එමෙන් ම, ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ බාහිර කථිකාචාර්යවරියක ලෙස ද සේවය කළා ය.

දිල්රුක්ෂිනී මහත්මිය ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර සහ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා ගෙන ඇත. ඇය දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලැබීමේ අපේක්ෂාවෙන් සිටියි.

**ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර**



ආචාර්ය හරිස්චන්ද්‍ර 2022 අප්‍රේල් මස සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස සේවය කිරීමට පෙර, එම දෙපාර්තමේන්තුවෙහි සහ දේශීය මෙහෙයුම් කටයුතු යන දෙපාර්තමේන්තුවල වසර 21කට අධික කාලයක් විවිධ තනතුරු දරමින් සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංග්ලාදේශය සහ භූතානය යන රටවල් සඳහා ඇමෙරිකාවේ වොෂින්ටන් නුවර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විකල්ප විධායක අධ්‍යක්ෂවරයා ලෙස නම් කර ඇති අතර, එම සේවා කාලය 2024 පෙබරවාරි මාසයේ සිට ඇරඹෙනු ඇත.

ආචාර්ය හරිස්චන්ද්‍ර මුදල් ප්‍රතිපත්ති කමිටුව, වෙළෙඳපොළ මෙහෙයුම් කමිටුව සහ කොළඹ වරාය නගරයේ ජාත්‍යන්තර මූල්‍ය කේන්ද්‍රය පිහිටුවීම සඳහා වූ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය. ඔහු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ උපදේශන කමිටු සභාපති විය. තවද, හරිත මූල්‍ය සමාලෝචන සමූහයේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ උපදේශක කමිටුවේ සභාපතිවරයා විය. එමෙන් ම, ඔහු මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙසද කටයුතු කර ඇත.

ආචාර්ය හරිස්චන්ද්‍ර එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියත්, එම විශ්වවිද්‍යාලයෙන් ම ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියත් කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධියත් ලබා ඇත.

**ඩී. එස්. ඩබ්ලිව්. සමරතුංග මහත්මිය**



සමරතුංග මහත්මිය 2021 වසරේ සිට බැංකු විදූ පියසේ අධ්‍යක්ෂිකාව ලෙස කටයුතු කළ අතර, සංඛ්‍යාන, ආර්ථික පර්යේෂණ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ, ජාත්‍යන්තර මෙහෙයුම් යන දෙපාර්තමේන්තුවල විවිධ තනතුරු දරමින් වසර 23කට අධික කාලයක් මහ බැංකුවේ සේවය කර ඇත. ඇය 2015 පෙබරවාරි මාසයේ සිට දෙවසරක කාලයක් මුදල් අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂිකාව ලෙස ද සේවය කළා ය.

සමරතුංග මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද, එක්සත් රාජධානියේ වෝර්වික් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව සහ මූල්‍යය පිළිබඳ විද්‍යාපති උපාධිය ද, කොළඹ විශ්වවිද්‍යාලයෙන් සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ද ලබා ඇත.

**ඊ. එච්. මොහොට්ටි මහත්මිය**



මොහොට්ටි මහත්මිය බැංකු අධීක්ෂණ, ලේකම්, ජාත්‍යන්තර මෙහෙයුම්, රාජ්‍ය ණය, ප්‍රාදේශීය සංවර්ධන, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ, මූල්‍ය බුද්ධි ඒකකය සහ සන්නිවේදන යන දෙපාර්තමේන්තුවල විවිධ තනතුරු දරමින් මහ බැංකුවෙහි වසර 23කට අධික කාලයක් සේවය කර ඇත.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය (රාජ්‍ය පරිපාලනය) පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් හි මොනෑෂ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර (බැංකු සහ මූල්‍ය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇත.

**ආර්. ඩී. ටී. ගුණසේකර මහත්මිය**



2021 වසරේ සිට ප්‍රතිපත්ති සමාලෝචන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂිකාව ලෙස කටයුතු කළ ගුණසේකර මහත්මිය, ඊට පෙර ලේකම්, රාජ්‍ය ණය, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු සහ සන්නිවේදන යන දෙපාර්තමේන්තුවල විවිධ තනතුරු දරමින්, මහ බැංකුවෙහි වසර 23කට අධික කාලයක් සේවය කර ඇත.

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද එම විශ්වවිද්‍යාලයෙන් ම වාණිජවේදී උපාධිය ද ලබා ඇති ගුණසේකර මහත්මිය, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකාවකි.